# ග්‍රීෂ්ම ඍතුවේ උණුසුම: අවධානය යොමු කළ යුතු කරුණු සහ පාඩම්

සියලු ප්‍රශංසා අල්ලාහ්ටම හිමිය! ඔහු තමාගෙන් මඟ පෙන්වීම පතන්නන්ට මඟ පෙන්වන්නාය. ඔහුගෙන් අයදින්නන්ට පිළිතුරු දෙන්නාය. ඔහුගේ පිහිට පතන්නන්ට උපකාර කරන්නාය. ඔහු නොමඟ යැවූවෙකුට මඟ පෙන්වීමට කිසිවෙකුට නොහැකිය, ඔහු මඟ පෙන්වූවෙකු නොමඟ යැවීමට ද කිසිවෙකුට නොහැකිය.

**(නුඹලා සමග වූ කවර භාග්‍යයක් වූව ද (ඒවා) අල්ලාහ් වෙතින්මය. පසුව පීඩාව නුඹලාව ස්පර්ශ කළේ නම් ඔහු වෙතම නුඹලා උදව් පතා විලාප නගන්නෙහුය.)**

**(අන්-නහ්ල්: 53)**

නැමදුමට සුදුසු අල්ලාහ් හැර වෙනත් කිසිදු දෙවියෙකු නොමැති බවටත්, ඔහු ඒකීය බවටත්, ඔහුට කිසිදු හවුල්කරුවෙකු නොමැති බවටත් මම සාක්ෂි දරමි. තවද මුහම්මද් (සල්) තුමාණන් ඔහුගේ ගැත්තා සහ දූතයා බවට මම සාක්ෂි දරමි. එතුමාණන්ටත්, එතුමාණන්ගේ පවුලේ අයටත්, සහභාමිකයින්ටත්, එතුමාණන් ව අනුගමනය කළ සැමටත් අප ඔහුව මුණගැසෙන දිනය දක්වා අල්ලාහ්ගේ ශාන්තිය හා සමාදානය අතිමහත් ලෙස හිමි වේවා!

අල්ලාහ්ගේ ගැත්තනි, අල්ලාහ්ට බියබැතිමත් වන්න (තක්වාධාරී වන්න).

**{විශ්වාස කළවුනි, අල්ලාහ්ට බිය භක්තිමත් වවු. තවද සෑම ආත්මයක්ම හෙට දින සඳහා (තමන්ට) පෙරටු කර ගත් දෑ පිළිබඳව අවධානය යොමු කරවු. තවද අල්ලාහ්ට බිය භක්තිමත් වවු. සැබැවින්ම අල්ලාහ් නුඹලා කරන දෑ පිළිබඳව අභිඥානවන්තයාය.}**

**[ අල්-හෂ්ර්: 18]**

**විශ්වාසවන්තයිනි!** මෙම ලෝකය පරීක්ෂාවන්ගේ සහ වෙහෙසෙහි නිවහනක් බවට පත් කිරීම අල්ලාහ්ගේ ප්‍රඥාවකි. එය දුක් කම්කටොලු සහ වෙහෙස මත පදනම් වී ඇත්තේ, මුඃමින්වරුන්ගේ (විශ්වාසවන්තයින්ගේ) අවනත වීම හා ඉවසීම පැහැදිලි කිරීමටත්, බලාපොරොත්තු සුන් වූවන්ගේ නොඉවසීම හා මැසිවිලි නැඟීම නිරාවරණය කිරීමටත්ය. අල්ලාහ් මෙසේ පවසයි:

**{(4) සැබැවින්ම අපි මිනිසාව දැඩි පරිශ්‍රමයක් තුළ (ජීවත් වන්නෙකු ලෙස) මැව්වෙමු.}**

**[අල්-බලද්: 4]**

මෙම පරීක්ෂණයේ එක් ස්වරූපයක් වන්නේ දේශගුණික තත්ත්වයන්ගේ වෙනස් වීමයි; එනම් ග්‍රීෂ්මය සහ ශීත ඍතුව අතර වෙනසයි. පැහැදිලි කාලගුණයකට පසු දූවිලි සහිත තත්ත්වයක් ද, පාද දැවෙන තරමේ උණුසුමක් ද, ඇටකටු රිදෙන තරමේ ශීතලක් ද ඇති වේ. මේ සියල්ලම සිදුවන්නේ ගැඹුරු ප්‍රඥාවකට අනුවය. එහි සංකේත සහ අර්ථයන් පිළිබඳව මෙනෙහි කිරීම අපට අනිවාර්ය වේ. අල්ලාහ් මෙසේ පවසයි:

**{අල්ලාහ් රාත්‍රිය හා දහවල (මාරුවෙන් මාරුවට) පරිවර්තනය කරන්නේය. සැබැවින්ම දෘෂ්ටිය ඇත්තන්ට එහි පාඩමක් ඇත.}**

[අන්-නූර්: 44]

**අල්ලාහ්ගේ ගැත්තනි!** මේ දිනවල අප අත්විඳින දැඩි උණුසුම, නොසැලකිලිමත් හදවත් අවදි කරන, පරලොව පිළිබඳව සිහිගන්වන පැහැදිලි සංකේතයකි. තවද, මෙම ලෝකය විවේක ගැනීමේ සහ කම්මැලි වීමේ ස්ථානයක් නොව, එය පරීක්ෂණයේ, උත්සාහයේ සහ ක්‍රියාවන්ගේ නිවහනක් බවට අනතුරු අඟවන සලකුණකි. එය මිනිසුන් තම නික්ම යාමේ දිනය (මරණය) සඳහා සූදානම් වීමටත්, තම පරමාධිපතිව මුණගැසීමට සූදානම් වීමටත් අවශ්‍ය මඟපෙන්වීමක් සපයයි:

**{ (එනම්) මලක්වරුන්* හා රූහ්(ජිබ්රීල්*) ඔහු වෙත ආරෝහණය වෙති. (එය) එක් දිනක(සිදුවන්නක්)ය. එහි(කාල) ප්‍රමාණය වසර පනස් දහසකි.}**

**[අල්-මආරිජ්: 4]**

එබැවින් දැවෙන හිරු රශ්මිය සහ දහවල් කාලයේ දහඩිය ගැලීම යනු, පරලොව දිනයේ මිනිසුන්ගේ තත්වය පිළිබඳ සමීප අත්දැකීමකි. එදිනට ඔවුන්ගේ පරමාධිපති ඔවුන් සියලු දෙනාවම එකම පිටියකට රැස් කරයි. ඔවුන්ට බරපතල දුෂ්කරතා පැමිණේ, කිසිදු පුවතක් ඔවුන්ට නොදැනී ව්‍යාකූල වේ. හිරු ඔවුන්ගේ හිසට ඉතා ආසන්නව පිහිටනු ඇත. ඔවුන්ගේ හදවත්වලට දැඩි බියක් ඇතුළු වේ. එම තත්ත්වය ඉතා භයානක වන අතර එහි වේදනාවද දෙගුණ තෙගුණ වේ.

**අල්ලාහ්ගේ දූතයාණන් (සල්) තුමාණෝ මෙසේ පැවසූහ: විනිශ්චය දිනයේදී සූර්යයා නිර්මාණවලට (මිනිසුන්ට) ඉතා ආසන්නයට ගෙන එනු ඇත. එය කොතරම්ද යත් ඔවුන්ගෙන් සැතපුමක් තරම් දුරින් එය පිහිටනු ඇත. එවිට මිනිසුන් ඔවුන්ගේ ක්‍රියාවන්හි ප්‍රමාණයට අනුව දහදියෙහි ගිලී සිටිනු ඇත. ඔවුන්ගෙන් සමහරෙකුගේ වළලුකර දක්වා ද, තවත් සමහරෙකුගේ දණහිස දක්වා ද, තවත් සමහරෙකුගේ ඉණ දක්වා ද දහදිය පවතිනු ඇත. තවත් සමහරෙකුට දහදියෙන් මුඛවාඩම් බඳිනු ඇත (දහදිය මුඛය දක්වා පැමිණේ). (මෙසේ පවසමින්) අල්ලාහ්ගේ දූතයාණන් (සල්) තුමාණන් තම දෑතින් මුඛය දෙසට සංඥා කළහ.**

[මික්දාද් බින් අල්-අස්වද් (රළි) තුමා විසින් වාර්තා කරන ලද මෙම හදීසය 'මුස්ලිම්' ග්‍රන්ථයෙහි සඳහන් වේ.]

**විශ්වාසවන්තයිනි!** එම අතිශය දුෂ්කර අවස්ථාවේදී, පරමාධිපති (අල්ලාහ්) තම කරුණාවෙන් එක් කණ්ඩායමක් විශේෂ කරනු ඇත. තවද, ඔහුගේ අතිමහත් ත්‍යාගයෙන් ඔවුන්ට ආශිර්වාද කරනු ඇත. ඔහුගේ සෙවණ හැර වෙනත් කිසිදු සෙවණක් නොමැති එදින, තම සිහසුනේ (අර්ෂ් හි) සෙවණ යටතේ සූර්යයාගේ උණුසුමින් ඔහු ඔවුන්ව මුදවා ගනු ඇත. අල්ලාහ්ගේ අතිමහත් වූ කරුණාව අපි ඔහුගෙන් අයදිමු.

එවිට ඔවුන්ගේ උසස් තත්ත්වය සහ ඔවුන් පසුවන සුන්දර තත්ත්වය දැක (අනෙක්) මිනිසුන් ඔවුන්ට ඊර්ෂ්‍යා කරනු ඇත (එවන් තත්ත්වයක් තමන්ටත් ලැබුණා නම් යැයි ප්‍රාර්ථනා කරනු ඇත). ඔවුන්ට හිමි වූ එම සෙවණින් බිඳක් හෝ ලබා ගැනීමට ඔවුන් කැමති වනු ඇත. නමුත් ඒ කෙසේ සිදුවන්නද! මන්දයත්, එම සෙවණ දිර්හාම් හෝ ඩිනාර් (මුදල්) දී මිලදී ගත නොහැකිය. ඒ වෙනුවට එය ලබා ගත හැක්කේ දිවා රාත්‍රී පුරාවට යහපත් ක්‍රියාවල නිරත වීමෙන් සහ සර්වබලධාරියාගේ කෝපයට

**හේතු වන දැවලින් වැළකී සිටීමෙන් පමණි. එම බේදවාචකයෙන් ගැලවීමේ එකම මාර්ගය සහ ජීවිතාරක්ෂාව වන්නේ යහපත් ක්‍රියාවල නිරත වීමයි.**

එදින (විනිශ්චය දිනයේ) දැවෙන උණුසුමින් ආරක්ෂා වීමේ මාර්ග අතරින් අබූ හුරෙයිරා (රළි) තුමා විසින් වාර්තා කරන ලද නබි (සල්) තුමාණන්ගේ පහත ප්‍රකාශය ද වේ:

"තම සෙවණ හැර වෙනත් කිසිදු සෙවණක් නොමැති දිනයේ (විනිශ්චය දිනයේ) අල්ලාහ් පුද්ගලයින් හත්දෙනෙකුට තම සෙවණ ලබා දෙයි. ඔවුන් නම්:

- යුක්තිගරුක නායකයා,
- අල්ලාහ්ගේ නැමදුමෙහි හැදී වැඩුණු තරුණයා,
- තම හදවත මස්ජිද සමඟ බැඳී ඇති (නිතර මස්ජිදයට යන) පුද්ගලයා,
- අල්ලාහ් වෙනුවෙන්ම එකිනෙකාට ආදරය කරමින් ඔහු වෙනුවෙන්ම එක්රැස් වී ඔහු වෙනුවෙන්ම වෙන්ව යන පුද්ගලයින් දෙදෙනා,
- රූමත් හා උසස් තනතුරක් ඇති කාන්තාවක් (පාපයක් සඳහා) ඇරයුම් කළ විට 'මම අල්ලාහ්ට බිය වෙමි' යැයි පවසන පුද්ගලයා,
- තම දකුණු අතින් දෙන දානය වම් අත පවා නොදන්නා තරමට රහසිගතව දන් දෙන පුද්ගලයා,
- තනිව සිටින විට අල්ලාහ්ව සිහිපත් කර දෙනෙතින් කඳුළු සලන පුද්ගලයා වෙති."

[බුහාරි සහ මුස්ලිම්].

**අර් රහ්මාන්ගේ (මහා කරුණාවන්තයාණන්ගේ) සෙවණ ලබා ගැනීමට හේතු වන තවත් කරුණු අතර:** ණය ගෙවීමට අපහසු තත්ත්වයක සිටින්නෙකුට සමාව දීම (කාලය ලබා දීම) සහ නියමිත කාලය පැමිණි විට ඔහුගේ ණය බර සැහැල්ලු කිරීම ඇතුළත් වේ. මන්දයත් එය සර්වාධිපති රජුන්ගේ (අල්ලාහ්ගේ) සමාව ලබා ගැනීමට හේතුවක් වේ.

**අබුල් යසාර් (රළි) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී: "අමාරුවෙන් ණය ගෙවන අයෙකුට කල් දෙන හෝ ඔහුගේ ණය කපා හරින ඕනෑම කෙනෙකුට අල්ලාහ් තම සෙවණ ලබා දෙනු ඇතැයි අල්ලාහ්ගේ දූතයාණන් (සල්) තුමාණන් පවසනු මම ඇසුවෙමි."**

[මුස්ලිම්]

**අල්ලාහ්ගේ ගැත්තනි, ඉන් තවත් කරුණක් නම්:** අල්ලාහ් වෙනුවෙන් (එකිනෙකාට) ආදරය කිරීම සහ ඔහුගේ තෘප්තිය වෙනුවෙන් එක්රැස් වීමයි. එහිදී භෞතික වාසි හෝ පෞද්ගලික අවශ්‍යතා සලකා බලනු නොලැබේ. ඔවුන් යනු ආගම පක්ෂපාතිත්වය සහ විරෝධය සඳහා පදනම කරගත්, සහ සහෝදරත්වයේ බැඳීම සඳහා විශ්වාසය (ඊමානය) ශක්තිමත් සම්බන්ධතාවක් කරගත් පිරිසකි. එහි ප්‍රතිඵලයක් ලෙස ඔවුන් සැබෑ වූත්, සදාකාලික වූත් ආදරයකින් ආශිර්වාද ලබන අතර උසස් වූ

ස්වර්ගයෙහි එහි සෙවණ භුක්ති විඳිනු ඇත. අබූ හුරෙයිරා (රළි) තුමා විසින් වාර්තා කරන ලදී: අල්ලාහ්ගේ දූතයාණන් (සල්) තුමාණන් මෙසේ පැවසූහ:

**විනිශ්චය දිනයේදී අල්ලාහ් මෙසේ පවසනු ඇත: මාගේ ශ්‍රේෂ්ඨත්වය වෙනුවෙන් එකිනෙකාට ආදරය කළ අය කොහේද? මාගේ සෙවණ හැර වෙනත් සෙවණක් නොමැති අද දිනයේ මම ඔවුන්ට මාගේ සෙවණ ලබා දෙමි.**

[මුස්ලිම්].

එම දුෂ්කර දිනයේ උණුසුමින් සහ අධික ශීතලෙන් ආරක්ෂා කරන තවත් දෙයක් නම්: **විවිධ ආකාරයේ දානයන්ය (සදකා).** දන් දෙන්නා ඔහුගේ යහපත් ක්‍රියාවට ප්‍රතිලාභයක් ලෙස අල්ලාහ්ගේ සෙවණින් ගෞරවයට පාත්‍ර වනු ඇත. නබි (සල්) තුමාණන් මෙසේ පැවසූහ:

**නියත වශයෙන්ම දානය (සදකා), එය ලබා දුන් අයට කබ්රයේ (මිණීවලේ) උණුසුම නිවා දමයි. තවද විනිශ්චය දිනයේදී මුඃමින්වරයා (විශ්වාසවන්තයා) සෙවණ ලබන්නේ තමා දුන් දානයේ සෙවණෙනි.**

[උක්බත් බින් ආමිර් (රළි) තුමා විසින් වාර්තා කරන ලද මෙම හදීසය තබරානි හි සඳහන් වේ.]

මාගේ මෙම ප්‍රකාශය , මා වෙනුවෙන් ද, ඔබ වෙනුවෙන් ද, සියලු මුස්ලිම්වරුන් වෙනුවෙන් ද, සෑම පාපයකින්ම සමාව ලබා දෙන ලෙස මහෝත්තම හා ශ්‍රේෂ්ඨ අල්ලාහ්ගෙන් මම අයදිමි.

## දෙවන දේශනාව

සියලු ප්‍රශංසා අල්ලාහ්ට ම හිමිය. තවද ඔහු විසින් තෝරාගනු ලැබූ ඔහුගේ ගැත්තන් වෙත ශාන්තිය හා සමාදානය හිමි වේවා!

අල්ලාහ්ගේ ගැත්තනි, අල්ලාහ්ට බියබැතිමත් වන්න. ඔබේ කාලය අල්ලාහ්ට අවනත වීම මගින් පවිත්‍ර කර ගන්න. ඔබේ ආයු කාලය අල්ලාහ්ට සමීප කරවන ක්‍රියාවන් සඳහා ආයෝජනය කරන්න. තවද ඔබේ දිනයන් යහපත් ක්‍රියාවලින් පුරවා ගන්න.

**අහෝ විශ්වාසවන්තයිනි!** සැබෑ වූ ද අවංක වූ ද මුඃමින්වරයා (විශ්වාසවන්තයා) යනු, අල්ලාහ් ප්‍රිය කරන සහ ඔහු තෘප්තිමත් වන දේවල් වෙත කඩිනමින් යොමු වන්නාය. ග්‍රීෂ්ම ඍතුවේ උණුසුමෙන් යම් ප්‍රමාණයක් ඔහුව ස්පර්ශ කළද, තම පරමාධිපතිගේ තෘප්තිය අපේක්ෂාවෙන් ඔහු සලාතයන් වෙත කඩිනම් වෙයි. තවද තම යහපත්කම් සහ බියබැතිමත්කම (තක්වාව) වැඩි කර ගැනීම සඳහා අල්ලාහ්ට අවනත වන ක්‍රියාවන් වෙත ඉක්මන් වෙයි. උසස් තරාතිරම් හිමිකර ගන්නා බුද්ධිමතා ඔහුය. තවද විනිශ්චය දිනයේ (මහ්ෂර් පිටියේ) දැවෙන උණුසුමින් තම සම ආරක්ෂා කරගන්නා වූ නුවණැත්තා ද ඔහුය.

නමුත් යමෙකු කාලගුණයේ උණුසුම හේතුවෙන් කම්මැලි වී සලාතයන්ට සහභාගී නොවන්නේ නම්, සහ අධික රස්නය නිදහසට කරුණක් කර ගනිමින් ජුම්ආ සලාතය සහ ජමාඅත් (සමූහ) සලාතයන් මඟ හරින්නේ නම්, ඔහු තමාගේම ආත්මය විසින් රවටනු ලැබූ, ඉබ්ලීස් (සාතන්) විසින්

මුළා කරනු ලැබූ අසරණ, අවාසනාවන්තයෙකි. ඔහු මුඃමින්වරුන්ගේ (විශ්වාසවන්තයින්ගේ) ගමන් මඟින් පසුගාමී වී ඇත. සකල ලෝකයන්හි පරමාධිපතිට අවනත වීම අතහැර දැමූ මුනාෆික්වරුන්ගේ (වංචනිකයින්ගේ) තත්ත්වයට ඔහු සමාන වී ඇත. ඔවුන්ගේ තත්ත්වය සහ ඔවුන් පැවසූ දේ විස්තර කරමින් අල්ලාහ් මෙසේ පවසයි:

**{ආත්ම වංචනිකයින් අතුරින් යුද්ධයට සහභාගී නොවී) රැඳී සිටියවුන් අල්ලාහ්ගේ රසූල්වරයාට පටහැණිව තමන්ගේ (නිවෙස්හික) හිඳගැනීම පිළිබඳව සතුටු වූවෝය. තවද ඔවුහු තම ධනයෙන් හා තම ප්‍රාණයෙන් අල්ලාහ්ගේ මාර්ගයේ ප්‍රයත්නය37 කිරීම පිළිකුල් කළෝය. තවද "නුඹලා (මෙම) උණුසුමෙහි (අල්ලාහ්ගේ මාර්ගයෙහි) පිටව නොයවු" යැයි ඔවුහු පැවසුවෝය. (නබිවරය) "නිරා ගින්න උණුසුමින් ඉතා දැඩිය." යැයි නුඹ පවසවු. (මේ පිළිබඳව) ඔවුහු වටහා ගන්නන්ව සිටියෙහු නම් (මැනව!)}**

[අත්-තව්බා: 81]

ඒ ආකාරයෙන්ම, තම පවුලේ අයගේ සහ දරුවන්ගේ අවශ්‍යතා සපුරාලීම සඳහා (ඔවුන්ගෙන් යැපීමෙන් වැළකීම සඳහා) උණුසුම දරාගනිමින් හලාල් (අනුමත) ආදායමක් සෙවීමට වෙහෙසෙන කම්කරුවන්ට සහ සේවකයින්ට මහත් වූ ප්‍රතිලාභ සහ උසස් ස්ථානයක් පිළිබඳව පොරොන්දු වී ඇත.

**කඃබ් බින් උජ්රත (රළි) තුමා විසින් වාර්තා කරන ලදී: නබි (සල්) තුමාණන්ගේ සහභාමිකයෝ පුද්ගලයෙකු පසුකර ගිය අතර, ඔහුගේ කඩිසරකම සහ රැකියාවේ නිරත වී ආදායම් සෙවීමේ උද්යෝගය දැක ඔවුහු පුදුමයට පත් වූහ. එවිට ඔවුන්, අල්ලාහ්ගේ රසූල්වරයාණනි, මොහු මේ දේ අල්ලාහ්ගේ මාර්ගයේ සිදු කළා නම් කොතරම් අගනේද!" යැයි පැවසූහ. එවිට නබි (සල්) තුමාණන් මෙසේ පැවසූහ:**

**ඔහු තම කුඩා දරුවන් වෙනුවෙන් වෙහෙස මහන්සි වී වැඩ කිරීමට පිටත් වූයේ නම්, ඔහු සිටින්නේ අල්ලාහ්ගේ මාර්ගයේය. ඔහු තමාගේම අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වෙහෙසීමට පිටත් වූයේ නම්, ඔහු සිටින්නේ අල්ලාහ්ගේ මාර්ගයේය.**

[තබරානි].

**අහෝ විශ්වාසවන්තයිනි!** ග්‍රීෂ්ම ඍතුවේ උණුසුම අපට අල්ලාහ් ලබා දුන් ආශිර්වාදයන් සිහිපත් කිරීමට හේතුවක් කර ගනිමු. ඔහු මෙම තාප පරිවාරක ගොඩනැගිලි සහ බහුලව ඇති වායු සමීකරණ යන්ත්‍ර අපට ලබා දී ඇත. එබැවින් ඒවා ප්‍රදානය කළ අල්ලාහ්ට අපගේ කෘතඥතාව සහ ස්තුතිය පුද කිරීමට ඉක්මන් වෙමු. ඉන්පසු ඒවා ආරක්ෂා කර ගැනීමටත්, ඒවා භාවිත කිරීමේදී විදුලිය නාස්ති නොකර, අදාළ බලධාරීන්ට සහයෝගය දැක්වීමටත්, නාස්තියෙන් හා අනිසි භාවිතයෙන් වැළකීමටත් අපි උත්සාහ කරමු.

එමෙන්ම, දැඩි දුෂ්කරතාවලට මුහුණ දී මෙම සෙවණ අහිමි වූ අයගේ පීඩාවන් ද අපට හැගිය යුතුය. ළිං කැණීම, සෙවණ ලබා දෙන නිවාස සහ කූඩාරම් ඉදිකිරීම, වායු සමීකරණ හා සිසිලන යන්ත්‍ර මිලදී ගැනීම සහ ග්‍රීෂ්ම උණුසුම මඟහරවා ගැනීමට අවශ්‍ය වෙනත් ක්‍රම ලබා දීම වැනි යහපත්

ක්‍රියාවන් හරහා ඔවුන්ට අනුකම්පා කිරීමටත්, ඔවුන්ගේ උණුසුම, පිපාසය සහ අසරණභාවය සමනය කිරීමටත් එය අපව යොමු කළ යුතුය.

අබූ හුරෙයිරා (රළි) තුමා විසින් වාර්තා කරන ලදී: නබි (සල්) තුමාණන් මෙසේ පැවසූහ:

යම් මිනිසෙක් ගමන් කරමින් සිටියදී ඔහුට දැඩි පිපාසයක් ඇති විය. ඔහු ළිඳකට බැස එයින් ජලය පානය කළේය. පසුව ඔහු පිටතට පැමිණි විට, පිපාසය නිසා පස ලෙවකන බල්ලෙකු දුටුවේය. එවිට ඔහු, මට ඇති වූ පිපාසය වැනිම පිපාසයක් මෙම බල්ලාටද ඇති වී තිබේ යැයි සිතා, නැවත ළිඳට බැස තම සපත්තුවට ජලය පුරවා, එය කටින් අල්ලාගෙන ගොඩට පැමිණ එම බල්ලාට ජලය පානය කිරීමට සැලැස්වීය. අල්ලාහ් ඔහුගේ මෙම ක්‍රියාව අගය කර ඔහුගේ පාපයන්ට සමාව ලබා දුන්නේය.

සහභාමිකයෝ, අල්ලාහ්ගේ රසූල්වරයාණනි! සතුන් වෙනුවෙන් කරන යහපත් ක්‍රියාවලට ද අපට කුසල් ලැබෙන්නේද?" යැයි ඇසූහ. එයට එතුමාණන් මෙසේ පිළිතුරු දුන්හ:

සෑම ජීවියෙකුටම (පණ ඇති සෑම සතෙකුටම) කරන යහපත් ක්‍රියාවක් වෙනුවෙන්ම කුසල් ඇත.

[බුහාරි සහ මුස්ලිම්].

යා අල්ලාහ්! දීප්තිමත් මුහුණක් සහ පියකරු නළලක් ඇති එතුමාණන්ට (නබිතුමාට) ඔබගේ ශාන්තිය හා සමාදානය අත් කරත්වා!

යා අල්ලාහ්! ඊමානය (විශ්වාසය) අපට ප්‍රියජනක කර, එය අපගේ හදවත් තුළ අලංකාරවත් කරනු මැනව. කුෆ්ර් (ප්‍රතික්ෂේප කිරීම), දුෂ්ටකම් සහ අකීකරුකම අපට අප්‍රියජනක කරනු මැනව. තවද අපව යහමඟ ලැබූවන් අතරට එක් කරනු මැනව.

යා අල්ලාහ්! ඉස්ලාමය සහ මුස්ලිම්වරුන්ව ශක්තිමත් කරනු මැනව. ෂිර්ක් (ආදේශ තැබීම) සහ මුෂ්රික්වරුන්ව (ආදේශ තබන්නන්ව) පරාජය කරනු මැනව. ඔබගේ ආගමට, ඔබගේ ග්‍රන්ථයට, ඔබගේ නබි (සල්) තුමාණන්ගේ සුන්නාවට සහ ඔබගේ විශ්වාසවන්ත ගැත්තන්ට ජයග්‍රහණය ලබා දෙනු මැනව.

යා අල්ලාහ්! ජීවතුන් අතර සිටින සහ මියගිය සියලුම මුස්ලිම් සහ මුඃමින් පිරිමි සහ කාන්තාවන්ට සමාව ලබා දෙනු මැනව.

යා අල්ලාහ්! අපේ රටේ ආරක්ෂාව වෙනුවෙන් කැප වී සිටින අපගේ සහෝදරයින්ව ආරක්ෂා කරනු මැනව.

යා අල්ලාහ්! අපගේ පාලකයාට සහ ඔහුගේ කිරුළ හිමි කුමරුට ඔබගේ මඟ පෙන්වීම ලබා දෙනු මැනව. ඔවුන්ගේ ක්‍රියාවන් ඔබට අවනත වන සහ ඔබ තෘප්තිමත් වන ක්‍රියාවන් බවට පත් කරනු මැනව. මෙම රට සහ සියලුම මුස්ලිම් රටවල් ආරක්ෂිත, සාමකාමී, ත්‍යාගශීලී, සෞභාග්‍යමත් සහ ඊමානයෙන් පිරි ආරක්ෂිත නිවහනක් බවට පත් කරනු මැනව. අමීන්!